# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 569 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 02/04/2024<br>පැය 1020 |

## මාධ්‍ය නිවේදනය

**සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් 09 ක් සහ තවත් සැකකරුවන් 03 ක් අත්අඩංගුවට - කළුතර, ගාල්ල, කොළඹ බස්නාහිර පළාත් දකුණ හා බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාස.**

2024.03.19 වන දින සිට බස්නාහිර පළාත හා දකුණු පළාත මූලික කර ගෙන ක්‍රියාත්මක සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි විශේෂ පොලිස් කණ්ඩායම් 20 ක් යොදවා මෙහෙයුම් ආරම්භ කරන ලදී. මෙම මෙහෙයුමට සම්බන්ධ බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය, බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය, කොළඹ අපරාධ කොට්ඨාසය, ගාල්ල අපරාධ කොට්ඨාසය හා කළුතර අපරාධ කොට්ඨාසයේ විශේෂ පොලිස් කණ්ඩායම් විසින් පහත වැටලීම් සිදු කර ඇත.

1. 2024.04.01 වන දින ගාල්ල අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ගෝනපීනුවල පොලිස් වසමේ දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ කාන්තාවක් අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 32 ක් වන ගෝනපීනුවල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

2. 2024.04.01 වන දින ගාල්ල අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් බේරුවල පොලිස් වසමේ දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායම් සාමාජිකයෙකු අයිස් මිලිග්‍රෑම් 360 ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන හිඳුරක්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

3. 2024.04.01 වන දින ගාල්ල අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් හික්කඩුව පොලිස් වසමේ තිරාණගම ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායම් සාමාජිකයෙකු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 01 මිලිග්‍රෑම් 100 ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන හික්කඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

4. 2024.04.01 වන දින කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් වාද්දුව පොලිස් වසමේ මැලෑගම ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන වාද්දුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

5. 2024.04.01 වන දින බස්නාහිර උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් මීගමුව නගරයේ දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන කිඹුලාපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

6. 2024.04.01 වන දින බස්නාහිර උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ගණේමුල්ල පොලිස් වසමේ මාකිලන්ගමුව ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන ගනේමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

7. 2024.04.01 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් වැල්ලම්පිටිය පොලිස් වසමේ කළු පාලම අසල දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 333 ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

8. 2024.04.01 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් කෙසෙල්වත්ත පොලිස් වසමේ මුහන්දිරම් පාර අසල දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකාවක් අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 50 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

9. 2024.04.01 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් පිටකොටුව පොලිස් වසමේ බැස්ටියන් මාවත අසල දී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙකු අයිස් මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 820 ක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන බත්තරමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඉහත අත්අඩංගුවට ගන්නා ලද අපරාධ කල්ලි සාමාජිකයින් 09 ට අමතරව ඔවුන් සමඟ විවිධ සම්බන්ධතා පවත්වමින් අපරාධවලට සහය දැක්වූ බවට සැක කරන තවත් සැකකරුවන් 03 ක් අත්අඩංගුවට ගෙන ඇත. **ඒ අනුව 2024.04.01 වන දිනට සැකකරුවන් 12 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**මෙම මෙහෙයුම් ආරම්භ කරන ලද 2024.03.19 වන දින සිට 2024.04.01 වන දින දක්වා සමස්ථ සැකකරුවන් හා සැකකාරියන් 237 අත්අඩංගුවට ගෙන ඇති අතර,** සංවිධානාත්මක අපරාධ සිදු කිරීම සඳහා සෘජුවම සහය දැක්වීම්, අපරාධ සැලසුම් කිරීම හා එම අපරාධ වලට ආධාර අනුබල දීම ආදී විවිධාකාරයෙන් සහය ලබා දුන් සැකකරුවන් හා සැකකාරියන් මේ අතර වේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධව කොළඹ අපරාධ කොට්ඨාසය, ගාල්ල අපරාධ කොට්ඨාසය, බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය, බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය සහ කළුතර අපරාධ කොට්ඨාසය මඟින් රැඳවුම් නියෝග ලබා ගෙන වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**